# 10 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

## ආණ්ඩුක්‍රමය



අන්තර්ගතය - A M R W S අමරතුංග - ගුරු උපදේශක - රත්නපුර අධ්‍යාපන කලාපය
සැකසුම - P G W ගුණතිලක - බප/කළු/ හිනටියාගල සිරි සීවලි මහා විද්‍යාලය , කළුතර

Copyright © e-thaksalawa.moe.gov.lk

# ආණ්ඩුක්‍රමය

- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
- ජනාධිපති ආණ්ඩුක්‍රමය

## පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය



- නාමික විධායකය හා (දේශපාලන විධායකය) සත්‍ය විධායකය ලෙස අංග 2 කි.
- ව්‍යවස්ථාදායකය තුලින් විධායකය තේරෙයි.
- විධායකය තම කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට වග කිව යුතුය.
- ව්‍යවස්ථාදායකයට ඕනෑම විටක විධායකය ඉවත් කළ හැකිය.

## ජනාධිපති ආණ්ඩුක්‍රමය

- විධායකය බලය **ජනාධිපති** විසින් හසුරවනු ලබයි.
- රාජ්‍යයේ නායකයා මෙන්ම ආණ්ඩුවේ නායකයා ද ජනාධිපතිවරයාය.
- ව්‍යවස්ථාදායකයට වගකීමට බැදි නැත.
- ව්‍යවස්ථාදායකයේ පාලනයට යටත් නොවේ.



## ක්‍රියාකාරකම් : -

’ විධායක බලය රටක සංවර්ධනයට ඉවහල් වේ ¶ යන මාතෘකාව ඔස්සේ විවාදයක් පවත්වන්න.

ඔබ ජීවත් වන පරිසරයේ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ඇතුලත්ව ඇති විටක එහි ජීවත් වන ඔබ පුරවැසියකු වන අතර පුරවැසියකු සැම විටම ආර්ථික, දේශපාලනික හා සමාජ සංස්කෘතික අයිතිවාසිකම් රැසක් භුක්ති විදි. එම අයිතිවාසිකම් භුක්ති විදින ඔබ ඒ හා බැදුනු යුතුකම් රැසකින් ඉටුකිරිමට වගකිමෙන් බැදේ.

- රජයට නියමිත බදු ගෙවිම.
- නිතියට ගරු කිරිම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරිම.
- නිතිය හා සාමය ආරක්ෂා කිරිමට සහය වීම.

**නිතිමය යුතුකම්**

**පුරවැසියා බැදෙන යුතුකම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන වගන්තියේ දැක්වේ.

- සමාජ සිරිත් විරිත් පිළිපැදිම.
- වැඩිහිටියන්ට ගරු කිරිම.
- සමාජ අභිවෘද්ධියට හානි නොකිරිම.

**සදාචාරාත්මක යුතුකම්**

# රජයේ වගකීම්

- නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
- සැමට සමානව සැලකීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම.
- නීතියේ සාධාරණත්වය සුරක්ෂිත කිරීම.
- රටේ සම්පත් සමානව බෙදී යන පරිදි කටයුතු කිරීම.
- රජයේ මුදල් කටයුතු විනිවිද භාවයෙන් පවත්වාගෙන යාම.
- සමාජ සුරක්ෂිතභාවය හා සුරක්ෂිත කිරීම.
- පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කිරීම.

## ක්‍රියාකාරකම් : -

පහත වගුව සම්පූර්ණ කරන්න.

| පාසලේදී | | නිවසේදී | |
|---|---|---|---|
| යුතුකම් | අයිතිවාසිකම් | යුතුකම් | අයිතිවාසිකම් |
| | | | |




## <u>ක්‍රියාකාරකම්</u> : -

වර්තමාන ශ්‍රී ලංකාවේ පවතින මැතිවරණ වර්ග නම් කර ඒවා පවත්වන අයුරු සැකෙවින් විස්තර කරන්න.